# කොළඹ නාලන්දා විද්‍යාලයීය
# විශ්‍රාමික ගුරු සංගමය

( ආරම්භය 1991 පෙබරවාරි 04 වන දින )

# ව්‍යවස්ථාව

CamScanner

01. නම : කොළඹ නාලන්දා විද්‍යාලයීය විශ්‍රාමික ගුරු සංගමය

02. ලිපිනය : 909/10, කේ. අදිකාරම් මාවත, ඇතුල්කෝට්ටේ.

03. ලාංඡනය :

04. ආදර්ශ පාඨය : ධම්මචාරී සුඛංසේති

(ධර්මානුකූලව හැසිරෙන තැනැත්තා සුවසේ කල් ගෙවයි.)

05. පරමාර්ථ :

5.1 නාලන්දා විද්‍යාලයීය විශ්‍රාමික ගුරුභවතුන් සංගමයක් වශයෙන් ඒකරාශිව තබා ගැනීම.

5.2 සාමාජික භවතුන් අතර සුහදතාවය පවත්වාගැනීමටත් ඔවුන්ගේ සුභසාධනයටත් කටයුතු කිරීම

5.3 ආගමික හා සමාජසේවා කාර්යයන් සඳහා සංගමයක් වශයෙන් සාමාජිකත්වය යොමු කිරීම.

06. සාමාජිකත්වය :

6.1 කොළඹ නාලන්දා විද්‍යාලයේ අවම වශයෙන් වසර 3 (තුනක) සේවයෙන් පසු එහිදීම විශ්‍රාම ලැබූ හෝ වෙනත් ආයතනයකින් විශ්‍රාම ලැබූ විදුහල්පතිවරුන්ට හා ගුරුභවතුන්ට සංගමයේ සාමාජිකත්වය ලබාගත හැක.

6.2 වසර 3 ක(තුනක) සේවා කාලයක් සපුරා නාලන්දා විද්‍යාලයෙන් ස්ථාන මාරුවීම් ලද විදුහල්පතිවරුන්ට හා ගුරුභවතුන්ට ආදි ගුරු සාමාජිකයන් ලෙස සාමාජිකත්වය ලබාගත හැක. එසේම ඔවුන් විශ්‍රාම ගැනීමෙන් පසු විශ්‍රාමික ගුරු ගණයට අයත් වේ.

6.3 විශ්‍රාම ලබා වසරක් ඇතුලත සාමාජිකත්වය ලබාගත යුතුය. ඉන් පසුව සාමාජිකත්වය ලබාගන්නේ නම් විශ්‍රාම ගිය දින සිට ඉල්ලුම් කරන දින දක්වා කාලය සඳහා වන සාමාජික මුදල් එකවර ගෙවිය යුතුය.

6.4 සාමාජිකත්වය ලබාගත් දින සිට වසර විස්සක් (20) සම්පූර්ණ වීමෙන් හෝ සාමාජිකයාගේ වයස අවුරුදු 80 (අසූව) සම්පූර්ණ වීම යන අවස්ථා දෙකෙන් ප්‍රථමයෙන් එලඹෙන අවස්ථාවේ සිට සාමාජික මුදල් ගෙවීමන් ඔහු හෝ ඇය නිදහස් වේ. එසේ වුවද තවදුරත් සාමාජිකයෙකු ලබන සියලු වරප්‍රසාද හා ප්‍රතිලාභ වලට හිමිකම් ලබයි.

6.5 අක්‍රිය සාමාජිකත්වය

යම් සාමාජිකයෙකු අදාල වර්ෂයේ ජනවාරි 01 දින සිට අඛණ්ඩව වර්ෂ (3) සාමාජික මුදල් ගෙවා නැති විට අක්‍රිය සාමාජික තත්වයට පත්වේ. අක්‍රිය සාමාජිකයන්ට මහ සභා රැස්වීම පිළිබඳ දැනුවත් කිරීමක් සිදු



CamScanner

කලද, එම කාලය තුල සාමාජිකත්වයට හිමි සෙසු සියලු වරප්‍රසාද අහිමි වේ. නමුත් ඕනෑම අවස්ථාවක අදාල හිග මුදල් ගෙවීමෙන් පසු සිය සාමාජිකත්වය සක්‍රිය කරගත හැක.

6.6 විධායක කමිටුවට පත්වීම

සාමාජිකත්වය ලබාගත් දින සිට වසර 3 ක් සම්පූර්ණ කල සාමාජික සාමාජිකාවන්ට විධායක කමිටුවට පත්විය හැකි අතර ඉහත සුදුසුකම් සපුරා ඇති ආදි ගුරු සාමාජික සාමාජිකාවන් දෙදෙනෙකුට (2) පමණක් එක් වර්ෂයකදී විධායක කමිටුවට පත්විය හැක. විධායක කමිටුවට පත්වන සියලු දෙනා අදාල වර්ෂය දක්වා සාමාජික මුදල් ගෙවා තිබිය යුතුය.

07. සාමාජික මුදල් : රුපියල් දහසක් (1000/-) ගෙවා සාමාජිකත්වය ලබා ගත හැකි අතර සෑම වසරකම මාර්තු 31 දිනට පෙර රු. 1000/- බැගින් වාර්ෂික සාමාජික මුදල් ගෙවිය යුතුය.

08. නිලධාරි මණ්ඩලය

8.1 අනුශාසකවරු - සංගමයේ සාමාජිකත්වය ලබාගත් නාලන්දා විදුහලේ හිටපු විදුහල්පතිවරු

8.2 සභාපති

8.3 උප සභාපතිවරු දෙදෙනෙක්

8.4 ලේකම්

8.5 උප ලේකම්

8.6 භාණ්ඩාගාරික

8.7 උප භාණ්ඩාගාරික

8.8 ගිණුම් පරීක්ෂක

8.9 සංස්කාරකවරු දෙදෙනෙක්

8.10 වෙබ් අඩවි කළමණාකරු

8 අ. සාමාජික සාමාජිකයන් අතුරින් දස දෙනෙකු විධායක කමිටුව සඳහා පත්කර ගත යුතු අතර මුලු විධායක කමිටුව 21 විය යුතුය.

8 ආ. සංගමයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තනතුරුවලට පත්වීමට අවම වශයෙන් අවුරුදු තුනක්(3) විධායක කමිටුවේ සාමාජිකත්වය දරා තිබිය යුතුය. මෙම තනතුරු විශ්‍රාමික සාමාජිකයන් සඳහා පමණක් සීමා වේ.

8 ඇ. විධායක කමිටුවට පත්වීම සඳහා සාමාජිකත්වය ලබා වසර (3) සම්පූර්ණ වී තිබිය යුතුය.

8 ඈ. තනතුරු වෙනස් කිරීමේදී සභාපති ලේකම්, භාණ්ඩාගාරික යන ප්‍රධාන තනතුරු වලින් එක් වසරකදී වෙනස් කල හැක්කේ එක් තනතුරක් පමණි.

09. වාර්ෂික මහා සභා රැස්වීම

සෑම වසරකම පෙබරවාරි මස අවසන් වීමට පෙර වාර්ෂික මහා සභා රැස්වීම



CamScanner

පැවැත්විය යුතුය. රැස්වීම කැඳවීමේ ලිපිය දින 14 පෙර සාමාජිකයන්ට යැවිය යුතුය. අදාල වර්ෂය තුල ඉටුකරණ ලද කාර්යයන් පිළිබඳ වාර්ෂික වැඩ වාර්තාවද ඉකුත් වාර්ෂික මහාසභා රැස්වීමේ වාර්තාවද ගරු ලේකම් විසින් සභාවට ඉදිරිපත් කල යුතුයි. අභිනව වර්ෂය සඳහා නිලධාරීන් තෝරා ගැනීමද මෙම රැස්වීමේදී සිදුකල යුතුය. සාමාජික භවතුන් මෙදින ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන යෝජනා වාර්ෂික රැස්වීමට දින හතකට (7) කලින් ලේකම් වෙත ලිඛිතව ලබාදිය යුතුය. එසේ ඉදිරිපත් කරණ යෝජනා, විධායක කමිටුව අනුමත කලහොත් පමණක් මහා සභා රැස්වීමට ඉදිරිපත් කල හැක.

**10. විධායක කමිටු රැස්වීම්**

විධායක කමිටු රැස්වීම් මසකට වරක් පැවැත්විය යුතුය. එහි ගණපූරණය සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව එකොලහකි.(11) මාසික රැස්වීම් වලට අමතරව අවශ්‍යතා අනුව විශේෂ කමිටු රැස්වීම් කැඳවිය හැක. රැස්වීම් කැඳවිය යුත්තේ සභාපති හා භාණ්ඩාගාරිකගේ අනුමැතිය ඇතිව ලේකම් විසිනි. සාමාජිකත්වයෙන් තුනෙන් එකක (1/3) ලිඛිත ඉල්ලීමක් මත විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට කමිටුවට බලය ඇත.

**11. සංගමයේ මුදල්**

11.1 සංගමයට ලැබෙන සෑම මුදලක් සඳහා සංගමයේ මුද්‍රිත ලදු පතක් භාණ්ඩාගාරික විසින් නිකුත් කල යුතුය.

11.2 සංගමයට ලැබෙන මුදල් විධායක කමිටුව අනුමත කරණ බැංකු ගිණුම් වල තැන්පත් කල යුතුය.

11.3 බැංකු ගිණුම් වලින් මුදල් ආපසු ලබාගැනීමේදී භාණ්ඩාගාරික සහ සභාපති/ලේකම් දෙදෙනාගෙන් එක් අයෙකුගේ අත්සන් වලංගු වේ.

11.4 සංගමයේ මුදල් වර්ෂය ජනවාරි මස පළමුවැනිදා (01) සිට දෙසැම්බර් මස තිස්එක (31) දක්වා වේ.

11.5 විගණනය කරන ලද ගිණුම් වාර්තාව වාර්ෂික මහා සභා රැස්වීමේදී භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කල යුතුයි.

11.6 සංගමයේ එදිනෙදා වියදම් සඳහා රු විසිදහසකට (රු. 20,000/-) නොවැඩි මුදලක් භාණ්ඩාගාරික ළඟ තබාගත හැක.

11.7 විධායක කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව භාණ්ඩාගාරිකට එක් වතාවකදී වියදම් කල හැකි මුදල රු. 10,000/- කි. ඒ සඳහා සභාපති හා ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. එසේ කරනු ලබන වියදම් සඳහා ඊලඟ කමිටු රැස්වීමේදී අනුමැතිය ලබාගත යුතුය.

11.8 මාසික අයවැය වාර්තාවක් භාණ්ඩාගාරික විසින් විධායක කමිටු රැස්වීමට ඉදිරිපත් කල යුතුය.

11.9 පහත පොත්පත් හා ලේඛන භාණ්ඩාගාරික පවත්වාගෙන යා යුතුය.



CamScanner

11.9.1 මුදල් පොත (බැංකු ගනුදෙනු සහිත)

11.9.2 ලෙජරය

11.9.3 ගෙවීම් වවුචර්

11.9.4 සාමාජික මුදල් ගෙවීම් ලේඛණය

11.9.5 ස්ථාවර තැන්පතු සහතික

11.9.6 ඉතිරි කිරීමේ ගිණුම් පොත

12. සංගමයෙන් කෙරෙන වියදම් හා ප්‍රදානයන්

12.1.1 වාර්ෂික සභා රැස්වීමට පෙර සංගම් මූලස්ථානයේ හෝ වෙනත් සුදුසු ස්ථානයක මහා සංඝරත්නය විෂයයෙහි සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනැමීම.

12.1.2 පැල්මඩුල්ලේ මිතුරු මිතුරෝ ආයතනය මගින් වාර්ෂිකව පවත්වන ගුරු උපහාර උලෙලේදී එම ආයතනයට පරිත්‍යාගයක් කිරීම.

12.1.3 සර්වෝදය සුබසෙත ළමා නිවාසයට වාර්ෂික රු. 2000 ක මුදලක් පරිත්‍යාග කිරීම.

12.1.4 රාජගිරියේ වික්ටෝරියා නිවාසයේ රෝගීන්ට වාර්ෂිකව ජනවාරි 25 දින දිවා ආහාරය සැපයීම.

12.2 අවමංගල අවස්ථාවට සහභාගිවීම හා අවමංගලාධාර පිරිනැමීම.

12.2.1 සාමාජික භවතුන්ගේ අභාවයකදී රු. 20000 ක මුදලක් පරිත්‍යාග කිරීම මෙහිදී සාමාජිකයාගේ සාමාජිකත්ව කාලසීමාව නොසලකා හැරේ.

12.2.2 සාමාජිකයාගේ කලත්‍රයාට හෝ එම පවුලේ මව/පියා/දරුවෙකු හෝ සාමාජිකයා විසින් ලිඛිතව නම්කල අයෙකු වෙත මෙම මුදල චෙක්පතක් මගින් පිරිනැමේ.

12.2.3 එම සාමාජිකයාගේ අවමංගල අවස්ථාවට සංගමයේ නියෝජනය වන පරිදි සහභාගිවන කණ්ඩායමේ ගමන් වියදම් සංගමයෙන් දැරිය යුතුය.

12.2.4 අවිවාහක සාමාජික/සාමාජිකාවකගේ මව හා පියාගේ අවමංගල අවස්ථාවට සංගමය නියෝජනය කල යුතු අතර ගමන් ගාස්තු සංගමය විසින් දැරිය යුතුය.

12.2.5 ඉහත අවස්ථා දෙකෙහිදීම සංගම් මූලස්ථානයේ සිට දුර කි.මී. 25 (විසිපහට) වැඩිනම් සංගමයෙන් ප්‍රවාහන පහසුකම් සංවිධායනය කල යුතුයි)

12.2.6 සංගමයේ සංවේගය ප්‍රකාශ කරන බැනර් පහත පරිදි ප්‍රදර්ශනය කල යුතුය.

අ සාමාජිකයාගේ හෝ කලත්‍රයාගේ අභාවයකදී

ආ අවිවාහක සාමාජිකයන්ගේ මව හෝ පියාගේ අභාවයකදී

12.3 වෛද්‍යාධාර පිරිනැමීම

12.3.1 සාමාජිකයෙකු රෝගාතුර වූ බව විධායක කමිටුව දැනුවත් වූ විට ඔහු/ඇය වෙනුවෙන් රු. විසිදහසක (20000/-) ආධාර මුදලක් පිරිනැමීමට කටයුතු කරනු ඇත.

12.3.2 සාමාජිකත්වය ලබා වසරක් ගතවූ අය වෛද්‍යාධාර සඳහා හිමිකම් ලබයි.

12.3.3 සාමාජිකත්වයේ වසරකට රු. 2000/- බැගින් උපරිමය රු. 20000/- කට යටත්ව පිරිනැමිය යුතු ආධාර මුදල විධායක කමිටුව විසින් තීරණය කරනු ඇත.



CamScanner

සාමාජිකයෙකුට හිමිකම් ඇත්තේ වෛද්‍යාධාර හෝ අවමංගල්‍යාධාර යන දෙකෙන් එකකට පමණි.

12.4 චාරිකා

12.4.1 එක් දින චාරිකා හා සුහද හමුව - පිරිවැයෙන් කොටසක් අවශ්‍ය පරිදි සංගමය දරණ අතර එක පුද්ගල පිරිවැය ගෙවා කලත්‍රයාටද සහභාගි විය හැක.

12.4.2 දින දෙකේ හෝ දින තුනේ චාරිකා - මෙයට කලත්‍රයාටද සහභාගි විය හැකි අතර පිරිවැය සහභාගි වන්නන් විසින් දැරිය යුතුය.

13. විශේෂ වෛද්‍යාධාර මුදල

අරමුණ බරපතල රෝගී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවන සාමාජික සාමාජිකාවන්ට ආර්ථික සහනයක් ලබා දීම.

මූල්‍යාධාර ගෙවීම

13.1 මෙම මූල්‍යාධාර සඳහා හිමිකම් ලබන්නේ සංගමයේ සක්‍රිය සාමාජිකයන් පමණි. තවද මෙම ආධාර මුදල් ලැබීම සඳහා අදාල මුදල් වර්ෂය දක්වා අඛණ්ඩව වාර්ෂික සාමාජික මුදල් ගෙවා ඇති අය සුදුසුකම් ලබයි.

13.2 විශේෂ වෛද්‍යාධාර ලබාදෙනුයේ සංගමයෙන් දැනට ලබාදෙන වෛද්‍යාධාර අරමුදලට අමතරවය.

13.3 විශේෂ වෛද්‍යාධාර ගෙවනුයේ සාමාජිකයෙකුට එක් වරක් පමණි.

13.4 විශේෂ වෛද්‍යාධාර ලැබීමට සාමාජිකත්වය ලබා වර්ෂයක් සම්පූර්ණ වී තිබිය යුතුය. විශේෂ වෛද්‍යාධාර එක් වර්ෂයකට රු. දස දහසක (රු. (10000/-)උපරිමයකට යටත්ව වර්ෂ 5 ක් සඳහා රු. පනස්දහසක් (50000/-) වේ. සාමාජිකත්ව ලැබීමෙන් පසු

| | | |
|---|---|---|
| 2 වන වර්ෂය | රු. | 10,000/- |
| 3 වන වර්ෂය | රු. | 20,000/- |
| 4 වන වර්ෂය | රු. | 30,000/- |
| 5 වන වර්ෂය | රු. | 40,000/- |
| 6 වන වර්ෂය | රු. | 50,000/- ක් වශයෙනි. |

13.5 විශේෂ වෛද්‍ය ආධාර මුදල් ගෙවීම

ගරු අනුශාසකවරයෙක්, සභාපති, උප සභාපතිවරුන්, ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික, උපභාණ්ඩාගාරික යන අයගෙන් සමන්විත අනුකාරක සභාවක් මගින් සිදුකල යුතුය. මේ සඳහා <u>සභාපති ලේකම් භාණ්ඩාගාරික ඇතුලු අවම වශයෙන් 5 දෙනෙකුගෙන් යුත් ගණපූරනයක් තිබිය යුතුය.</u>

13.6 වෛද්‍යාධාර සඳහා හිමිකම් ලැබීමේ නිර්නායක

1. හෘද රෝග (බයිපාස්, ස්ටෙන්ත් දැමීම, පේස් මේකර්)
2. වකුගඩු රෝග (අක්‍රියවීම, බද්ධ කිරීම, රුධිර කාන්දුකරණය)
3. පිළිකා රෝග



CS CamScanner

4. අක්මාවේ සැත්කම්
5. අස්ථි බද්ධය (උකුල් ඇට, දණිස්)
6. පූර්ණ අන්ධභාවය
7. අංශභාගය
8. හදිසි අනතුරු හේතුවෙන් මාස 3කට වඩා ඔත්පලව සිටීම.

වෛද්‍යාධාර ලබාගැනීම සඳහා ඉදිරිපත් කල යුතු ලිපි ලේඛන පහත ලේඛනවල මුල් පිටපත් හා ඡායා පිටපත් ඉල්ලුම්කරු විසින් ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය.

1. ඉල්ලුම්පත
2. වෛද්‍ය නිර්දේශ හා වෛද්‍යවාර්තා
3. රෝහල් බිල්පත්
4. ඖෂධ වට්ටෝරු
5. ඖෂධ මිලදීගත් බිල්පත්
6. වෙනත් අදාලවේ යැයි සැලකෙන ලේඛණ

මණ්ඩලයේ තීරණය උක්ත විය යුතු අතර එම ලේඛණය ඊලඟ විධායක කමිටුවට ඉදිරිපත් කල යුතුය.

1. වෛද්‍යාධාර ලාභියාගේ නම සහ සාමාජික අංකය
2. වෛද්‍ය වාර්තා අනුව රෝගය
3. ප්‍රතිකාර සඳහා වැයකර ඇති මුදල
4. ලදුපත් වලින් තහවුරු වී ඇති වියදම්
5. අනුමත කල වෛද්‍යාධාර මුදල
6. කමිටු සාමාජිකයන්ගේ අත්සන්

ඉහත සුදුසුකම් සපුරා නැති වුවද රෝගියා අසාධ්‍යතාවයේ පසුවන්නේ නම් වෛද්‍යාධාර පිරිනැමීම පිළිබඳ තීරණයක් ගැනීමට අනුකාරක සභාවට බලය තිබේ.

මණ්ඩලය විසින් අනුමත කල වෛද්‍යාධාර මුදල තමාට හිමිවිය යුතු ආධාර මුදලට වඩා අඩුනම් පසුව රෝගී අවස්ථාවකදී හිමිකම් සඳහා අයදුම් කල හැක.

විධායක කමිටුව විසින් ඉදිරිපත් කරණ ව්‍යවස්ථා සංශෝධන මහා සභා රැස්වීමේ බහුතර ඡන්දයෙන් සම්මත විය යුතුයි.



CS CamScanner